පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

2021 නොවැම්බර් 08 සිට නොවැම්බර් 14 දක්වා සතිය

විෂය} මව්බස

සතිය- 28

ශ්‍රේණිය:- 1

සැකසුම:- ර/ඇඹි/වෙරළුගහමුල වි. /1 ශ්‍රේණිය /එල්.ජී.ඩී.ජයමිණි මිය

- “දුවේ පුතේ”මේ පින්තූරය නිරීක්ෂණය කරන්න



- **සිංහල අවුරුදු කාලය පිළිබඳ පින්තූරය ක් ඔබට පේනවා නේද?**

**එය බලා පහත ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න**

* ආච්චි මොකද කරන්නේ? ……………………………………………………………
* ගසේ අත්ත උඩ ඉන්නේ කවු ද?……………………………………………………
* ගස්වල තිබෙන ගෙඩි මොනවා ද?………………………………………………
* රබන් ගහන්නේ කවු ද?……………………………………………………………

- **පින්තූරයේ ඇති දේවල් ඇසුරෙන් 'හරි වැකි' සහ 'වැරදි වැකි' ලකුණු කරන්න**

මල්ලි ඔංචිලි පදිනවා . (          )
නැන්දලා රබන් ගහනවා. (          )
ආච්චි කැවුම් බදිනවා. (          )
අඹ ගසේ කොහා සිටිනවා. (     )

**"දුවේ පුතේ" ඔංචිලි වාරම් ගායනා කරන්න.**

ඔංචිලි චිලි චිල්ල මලේ - වැල්ල දිගට නෙල්ලි කැලේ
කඩන්න බැරි කටු අකුලේ - කඩා දෙන්න මගේ මලේ

උඩයන රවුමට පපුවයි දන්නේ - පහළට එනවිට නිවලයි එන්නේ
පොල්ලක් පැන්නත් බය නොසිතන්නේ - පත්තිනි දෙවිඳුනි අප රැක දෙන්නේ

**මෙම රබන් පදය ගායනා කරන්න**

'උඩින් උඩින් වර පෙත්තප්පු
බිමින් බිමින් වර පෙත්තප්පු
උඩින් උඩින් වර - බිමින් බිමින් වර
කැවුම් කන්න වර පෙත්තප්පු'

**දැන් බංකුවකට හෝ වෙනත් ශබ්දය ගෙන දෙන භාණ්ඩයකට තට්ටු කරමින් ගායනා කරන්න.**